**පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව - 2024**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාව සතු මෝටර් ග්‍රේඩරයේ වටිනාකම රු 15,500,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද, රු 18,500,000 ක් වූ පිරිවැයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළියල කිරීමේ දී ජ'නල් සටහනක් මගින් නිවැරදි කරන බව. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට රු 1,556,232 ක් වූ ලැබිය යුතු ආයෝජන පොලී (ස්ථාවර තැම්පතු පොලී ) ආයෝජන ගිණුමට හර කර තිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමේ දී ජ'නල් සටහනක් මගින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වත්කම් ලේඛනවල ඇතුළත් රු 100,000 ක් වූ ඉහළ ඇස්සැද්දුම පිල්ලෑව නැමැති ඉඩමේ (පොදු සුසාන භූමිය ) වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය පිළියල කිරීමේ දී ඇතුලත් කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඉඩම් හා ගොඩනැඟිලි ඒකක 71 ක වටිනාකම රු.25, රු.50, රු.100, රු.1000 ක් හා රු.2000 වන පරිදි සාවද්‍ය ලෙස ගිණුම් ගත කර තිබුණි. | මෙම ඉඩම් ප්‍රත්‍යාගණනයක් සිදු කර එම වටිනාකම් 2025 මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගිණුම්ගත කරන බව. | සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුලදී රු 59,000 කට මිලදී ගත් Canon ME 2010 Laser ප්‍රින්ටරයේ වටිනාකම රු 259,000 ක් ලෙස, රු.200,000 ක් වැඩියෙන් යන්ත්‍රෝපකරණ ගිණුමේ දක්වා තිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමේ දී එම වරද නිවැරදි කරන බව. | වටිනාකම නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් රෙගුලාසි 570 හා 571 | කල් ඉකුත් වූ රු.889,000 ක තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.570 හා 571 අනුව වසර 02 ඉක්මවූ ඉකුත් තැන්පතු ඉදිරියේදී නියාදනය කිරීමට හෝ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2018 ජනවාරි 26 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| | 05 වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව මානව සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබුණි. | ඉදිරි වසර සඳහා එලෙසින්ම මානව සම්පත් සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛය අනුව මානව සංවර්ධන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ | | | |
| | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද වත්කම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛය හා කොම්ප්ට්‍රෝලර් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය | රජයේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ යුතු වුවද , සභාවේ වාහන හැර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | සභාව සතු සියළුම වත්කම් සඳහා ඉදිරියේදී විධිමත් ප්‍රත්‍යාගණනයක් සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | වත්කමේ සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කළ යුතුය. |
| | 03 වන හා 04 වන ඡේද | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී රු 5000 හෝ ඊට වැඩි වටිනාකම් සහිත මූල්‍ය නොවන වත්කම් හඳුනා ගත යුතු වුවද , සභාව විසින් 5000ට අඩු ඉඩම් 71 ක්ද, යන්ත්‍රෝපකරණ 27 ක්ද, ලී බඩු හා සවිකිරීම් අයිතම 122 ක්ද මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. | 2025 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී මෙම භාණ්ඩවල මිල වර්තමාන වටිනාකම් අනුව රු.5000 ට අඩු වටිනාකමින් යුත් භාණ්ඩ වේ නම් එම භාණ්ඩ පරිභෝජන භාණ්ඩ ගිණුමට මාරු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,323,740ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,770,587ක් විය.

### 2.2 ආදායම් පරිපාලන

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 2,507 | 1,740 | 2,037 | - | 1835 | 1739 | 2362 | - |
| (ii) | බදු කුලී | 30,813 | 29,282 | 28,980 | 403 | 16,431 | 22,453 | 22,522 | 107 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,650 | 2,765 | 2,765 | - | 3450 | 2401 | 2401 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,205 | 9,815 | 9,809 | - | 5800 | 616 | 206,888 | - |
| | | 40,175 | 43,602 | 43,591 | 403 | 27,516 | 27,209 | 234,173 | 107 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්‍ය සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමට පසුගිය වර්ෂයේ අවසාන හිඟ ආදායම එකතු කර රැස්කළ ආදායම අඩුකල පසු දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම විය යුතු වුවද ඉදිරිපත් කළ දත්ත අනුව මෙම සංඛ්‍යා අතර පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය කෙරේ. | ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින පරස්පරතාවය නිවැරදි කර ඉදිරිපත් කරන බව. | ආදායම පිළිබද නිවැරදි දත්ත ඉදිරිපත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය ලෙස රු.236,570 ක් හා පුනරාවර්තන වැය ලෙස රු.26,665,962 ක් දරා තිබුණු අතර දිරන කසළ හා නොදිරන කසළ අලෙවියෙන් රු.143,570 ක් පමණක් රැස් කර තිබුණි. | ප්‍රදේශිය සභාව මඟින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් අතර ප්‍රමුඛ හා සාමාජ සත්කාරක සේවාවන් අතර ඉහලින්ම ඇති කාර්යයක් වන අතර මෙම වියදම්වලට සරිලන මට්ටමින් කසළ අලෙවියෙන් හා පොහොර අලෙවියෙන් ඉහල ආදායමක් ලබා ගැනිමට නොහැකි වන අවස්ථා ඇති බව. | දිරන කසළ හා නොදිරන කසළ නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 1ත් 5 ත් අතර කාලයක සිට ලැබිය යුතු ගිණුම් 07 ක රු. 59,547,495 ක් අයකර ගත යුතුව පැවතුණි. | ඉතිරි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 10 ක එකතුව රු.65,737,246 ක් වූ අතර ඒ තුල වර්ෂ 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු 59,407,494 ක් හා වර්ෂ 5 ට වැඩි රු 6,329,752 ක් පැවතුණි. මේවායේ පැවැත්ම තහවුරු කරගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ශේෂවල පැවැත්ම තහවුරු කරගෙන ගෙවිය යුතු මුදල් පියවා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්කර 17.2 කට ආසන්න වූ ටෙන්ඩර් මගින් බදු දීමට නොහැකි වූ ඉඩම් 29 ක් කිසිඳු කාර්යයකට භාවිතා නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | තෙවන වරටත් ටෙන්ඩර් කරනු ලැබූ නමුත් බදු කරුවන් ඉදිරිපත් නොවූ ඉඩම්වල පොල් ඵලදා ආදායම සභාව විසින් ලබා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් වඩා ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලීබඩු හා සවිකිරීම් සඳහා වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉන්වෙන්ට්‍රි ලේඛන තුල අදාල තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරන අතර ලී බඩු හා සවිකිරීම් සඳහා වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | විධිමත්ව වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු ඉඩම් විධිමත් පරිදි සමීක්ෂණය සිදු කර ඒවායේ පැවැත්ම හා ආරක්ෂාව භෞතිකව තහවුරු වන පරිදි වැට මායිම් යොදා නොතිබුණි. | ඉදිරියේදී ඉඩම්වලට මායිම් දමා කම්බි ගැසීම , අයවැය මගින් මුදල් වෙන් කර අදාල කාර්ය සිදුකිරීමට අපෙක්ෂා කරන බව. | වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු තර ගත යුතුය. |
| (ඇ) | පිරිවැය රු. 650,000ක් වූ ජල බවුසරය, සමාලෝචිත වර්ෂයේ මෝටර් වාහන හා යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනයේදී , ප්‍රත්‍යාගණනය සිදු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී එය ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව. | වත්කම් පන්තියට අයත් සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 15 ක අයිතිය හා සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 135 කින් සුසාන භූමි131 කම අයිතිය සභාව සතුව නොතිබුණි. | සුසාන භූමි පවරා ගැනීම සඳහා පඩුවස්නුවර නැගෙනහිර හා පඩුවස්නුවර බටහිර ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික දීමනා පදනම යටතේ බඳවා ගත් සේවකයින් 05 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.2,564,328 ක් ගෙවීම් කර තිබුණි. | 2013 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය මෙම ආයතනයෙන් ඉටුකරන සේවාවන් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් අනියම්, ආදේශක, දෛනික සේවකයින් 05 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ගිවිසුම් පදනම මත සේවය සඳහා බඳවාගෙන ඇති බව. | අතිරික්ත සේවකයන් අනුමත කරගත යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 07 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 02 සිට සියයට 80 දක්වා විචලනයක් හා වියදම් විෂයයන් 08 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර සියයට 20ට වඩා වැඩි විචලනයක් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබු බව නිරීක්ෂණය කෙරේ. | වියදම් පාලනය කිරීම, අනුමැතිය නොලැබීම, මිල ගණන් අඩුවීම ආදී හේතුමත මිල විචලනයන් හටගෙන ඇති බව. | අයවැය ලේඛනය ඵලදායීව කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගත යුතුය. |